Sakya Academy of Higher Education | learnonline by sakya

# ව්‍යාපාර අධ්‍යයනය
# 2022 SAP

## Online ව්‍යුහගත ප්‍රශ්න පත්‍රය සඳහා උපදෙස් පත්‍රිකාව

01. ප්‍රශ්න පත්‍රය ''I'' කොටස සහ ''II'' කොටස ලෙස කොටස් දෙකකින් යුක්ත වේ. ''I'' කොටසේ ප්‍රශ්න තුනක් ද, ''II'' කොටසේ ප්‍රශ්න තුනක් ද බැගින් මුළු ප්‍රශ්න හයකි.

02. පිළිතුරු සැපයීම සඳහා පැය **දෙකයි මිනිත්තු දහයක** කාලයක් ලැබේ. **පළමු මිනිත්තු දහයක** කාලය තුළ ප්‍රශ්න පත්‍රය හොඳින් කියවා පිළිතුරු සපයන ප්‍රශ්න තෝරා ගන්න.

03. ''I'' කොටසින් ප්‍රශ්න **දෙකක්** ද, ''II'' කොටසින් ප්‍රශ්න **දෙකක්** ද තෝරාගෙන මුළු ප්‍රශ්න **හතරකට** පමණක් පිළිතුරු සපයන්න.

04. පිළිතුරු සැපයීම සඳහා A4 හෝ Foolscap ප්‍රමාණයේ කඩදාසි කොළ භාවිතා කරන්න. සෑම කොළයක ම හතර පැත්තෙන් ම අඟල් භාගයක මායිම ඉඩ (Margin) තබන්න.

05. පිළිතුරු පත්‍රයේ **මුල් පිටුවේ** පහත සඳහන් දෑ පමණක් ලියා තබන්න.

    (i) විභාගයේ නම
    උදා : 2022 SAP Final I

    (ii) ඔබේ සක්‍යා ශිෂ්‍ය හැඳුනුම්පත් අංකය
    (සක්‍යා ශිෂ්‍ය හැඳුනුම්පත් අංකයක් ලැබී නොමැති විභාග අපේක්ෂකයන් තම ජාතික හැඳුනුම්පත් අංකය භාවිතා කරන්න.)

    (iii) පිළිතුරු ලියන ලද ප්‍රධාන ප්‍රශ්න අංක අනුපිළිවෙළින්
    උදා : 01, 02, 04, 05

    (iv) පිළිතුරු සපයන ලද මුළු පිටු ගණන

06. පිළිතුරු පත්‍රයේ **සෑම පිටුවක** ම පිටු අංකය, සක්‍යා හැඳුනුම්පත් අංකය / ජාතික හැඳුනුම්පත් අංකය නිවැරදි ව සටහන් කරන්න.

07. සෑම **ප්‍රධාන** ප්‍රශ්නයක් ම අලුත් පිටුවකින් ආරම්භ කරන්න.

08. පැහැදිලි අත් අකුරින් පිළිතුරු සපයන්න. පිළිතුරු සැපයීම සඳහා පැන්සල් භාවිතා නො කරන්න. පිළිතුරු පත්‍රය තුළ අනවශ්‍ය සටහන් ඇතුළත් නො කරන්න.

09. ප්‍රශ්න පත්‍රයට නියමිත කාලය අවසානයේ දී පිළිතුරු පත්‍රයේ සම්පූර්ණ තොරතුරු පැහැදිලිව පෙනෙන පරිදි සෑම පිටුවක ම ඡායාරූප ගෙන ඔබට දී ඇති link එක වෙත upload කරන්න. සෑම පිටුවක් ම upload කිරීමට වගබලා ගන්න.

10. පිළිතුරු පත්‍රය upload කිරීම සඳහා පැය භාගයක කාලයක් හිමි වේ. තාක්ෂණික දෝෂ හේතුවෙන් එම කාලය තුළ upload කරගත නොහැකි වන විභාග අපේක්ෂකයින් ඔබට ලබා දෙන whatsapp අංකයට පිළිතුරු පත්‍රයේ ඡායාරූප එවන්න.

SAP - 04/2022/32S-II

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

සක්‍යා උසස් අධ්‍යාපන ආයතනය
Sakya Academy of Higher Education

SAP EXAMINATION

# සක්‍යා උසස් පෙළ පෙරහුරු විභාගය 2022
# Sakya Advanced Level Preparatory Examination 2022

| | | |
|---|---|---|
| ව්‍යාපාර අධ්‍යයනය II<br>Business Studies II | 32 S II | Final 1 |

| | |
|---|---|
| *පැය දෙකයි*<br>*Two Hours* | අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි<br>Additional Reading Time - 10 minutes |

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.**

**උපදෙස්**

* එක් කොටසකින් ප්‍රශ්න දෙක බැගින් මුළු ප්‍රශ්න **හතරකට** පිළිතුරු සපයන්න.

## I කොටස
(මෙම කොටසින් ප්‍රශ්න දෙකක් තෝරා ගන්න)

01. විශාල වැවකින් පෝෂණය වන වෙල්යායකට මැදිව මිහිලගේ නිවස පිහිටා තිබේ. වෙල්යායෙන් එකතු කර ගන්නා පිදුරු සහ ගොම පොහොර භාවිත කරමින් වී වගාව සහ එළවළු වගාවන්ට අවශ්‍ය කොම්පෝස්ට් පොහොර නිපදවා අලෙවි කිරීම සඳහා **"මිහිල කොම්පෝස්ට්"** නමින් කුඩා නිෂ්පාදනාගාරයක් ජාත්‍යන්තර පරිසර දිනය දා සිය නිවසේ දී ආරම්භ කෙරිණි. කොවිඩ් 19 වසංගතය හේතුවෙන් රටේ පැවතුණු නිරෝධායන ඇඳිරි නීතිය සමග පැනවූ සංචරණ සීමා සහ කාබනික පොහොර ප්‍රචලිත කිරීමේ රජයේ ප්‍රතිපත්තිය නිසා මෙන් ම දැරිය හැකි මිල ගණන් අය කිරීම නිසා සිය නිෂ්පාදනවලට ඉල්ලුම ඉහළ ගියේ ය. මේ හේතුවෙන් අත්‍යවශ්‍ය සේවා අවසරය මත මාර්ගගත ක්‍රමයට දුරකථනයෙන් ඇණවුම් ලබා ගෙන පියාගේ කුඩා ලොරි රථයෙන් ගොවිබිම් වෙත බෙදාහැරීම ආරම්භ කෙරුණි.
   - (i) (අ) ඉහත සිද්ධියෙහි ඇතුළත් අවශ්‍යතා **දෙකක්** නම් කර, ඒවා සපුරාලන ආකාරය සඳහන් කරන්න.
     (ආ) "මිහිල කොම්පෝස්ට්" ව්‍යාපාරය විසින් භාවිත කරන යෙදවුම් **දෙකක්** නම් කර ඒවා අයත් වන නිෂ්පාදන සාධකය දක්වන්න. (ලකුණු 04 යි)
   - (ii) ඉහත සිද්ධියෙහි දක්වෙන ව්‍යාපාර ගති ලක්ෂණ **දෙකක්** සැකෙවින් විස්තර කරන්න. (ලකුණු 04 යි)
   - (iii) "මිහිල කොම්පෝස්ට්" යන සුළු ව්‍යාපාරයෙන් මෙරට ආර්ථිකයට ලැබෙන ප්‍රතිලාභ කවරේදැයි පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)
   - (iv) මෙම සිද්ධියෙහි ඇතුළත් සාර්ව පරිසර බලවේග අතර අන්තර් සම්බන්ධය පෙන්වන අවස්ථා **දෙකක්** දක්වන්න. (ලකුණු 04 යි)
   - (v) (අ) තිරසර සංවර්ධනයේ නූතන භාවිතයන් වන 4R සංකල්පයේ කවර විචල්‍යයක් තුළට කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය අයත් කළ හැකි ද ?
     (ආ) මෙම සිද්ධියේ සඳහන් පරිදි මිහිල විසින් ගනුදෙනුකරුවන් වෙත හා සමාජය වෙත ඉටු කරන සමාජ වගකීම් කෙබඳු වේදැයි පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

   (මුළු ලකුණු 20 යි)

02. (i) අද බොහෝ පුද්ගලයින් හා ව්‍යාපාර ඇතැම් කටයුතු බාහිර ආයතනවලට පවරා ඉටුකර ගැනීමේ ප්‍රවණතාවක් දැකිය හැක. මෙය **ව්‍යාපාර ක්‍රියාවලි බැහැරගත කිරීම** (Business Process Outsourcing / BPO) ලෙස හඳුන්වයි. එහි වාසි **දෙකක්** සහ අවාසි **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 04 යි)
   - (ii) (අ) පාරිභෝගික ආරක්ෂණය සම්බන්ධයෙන් මෑත කාලයේ සක්‍රීයව ක්‍රියාත්මක වන අණ පනත් **දෙකක්** ලියන්න.
     (ආ) ශ්‍රී ලංකා ආර්ථිකයට විදේශීය ප්‍රේෂණවල ඇති වැදගත්කම් **දෙකක්** සඳහන් කරන්න (ලකුණු 04 යි)
   - (iii) මූල්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව භාවිත කරන එක් උපකරණයක් වන්නේ ණය සීමා පැනවීමයි. එය ප්‍රමාණාත්මක ස්වරූපයෙන් මෙන් ම ගුණාත්මක ස්වරූපයෙන් ද ක්‍රියාත්මක කරයි. ප්‍රමාණාත්මක ණය සීමා සහ ගුණාත්මක ණය සීමා නිදසුන් සහිත ව පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

(iv) ව්‍යාපාරයක් සිය සේවකයින්ට හා ගනුදෙනුකරුවන්ට ඉටුකළ යුතු සමාජ වගකීම් හා ආචාර ධර්ම **දෙක** බැගින් වෙන වෙන ම ලියන්න. (ලකුණු 04 යි)

(v) සාමාජික සංඛ්‍යාව, වගකීම, ප්‍රාග්ධන සම්පාදනය සහ කළමනාකරණය යන ශීර්ෂ හතර යටතේ හවුල් ව්‍යාපාරය, සීමාසහිත පෞද්ගලික සමාගම, සීමාසහිත පොදු සමාගම සහ සමූපකාර යන ව්‍යාපාර සංවිධාන වර්ග අතර සැසඳීමක් කරන්න. (ලකුණු 04 යි)

(මුළු ලකුණු 20 යි)

03. (i) (අ) කොවිඩ් - 19 පැතිරීම හේතුවෙන් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා ඇති වී තිබෙන ව්‍යාපාර අවසථා **හතරක්** සඳහන් කරන්න.

(ආ) ව්‍යාපාරයක් ආර්ථික තිරසර බව වෙනුවෙන් කටයුතු කරන විට අවධානය යොමු කළ යුතු කරුණු **දෙකක්** සඳහන් කර, ඒ එක් එක් කරුණ ඉටුකර ගැනීමට ව්‍යාපාරිකයෙකුට ගත හැකි ක්‍රියාමාර්ගය බැගින් සඳහන් කරන්න. (ලකුණු 04 යි)

(ii) (අ) පහත දැක්වෙන්නේ බලපත්‍රලාභී වාණිජ බැංකුවක ප්‍රචාරණ දැන්වීමකින් උපුටා ගත් ප්‍රවෘත්ති කාණ්ඩයකි.

''A A A (lka) යන තත්ත්වය හිමි පළමු බැංකුව අපයි.''

මෙම සංකේත පෙළේ අර්ථය පැහැදිලි කර, ඉන් තැන්පතුකරුවකුට එළඹිය හැකි නිගමනයක් දක්වන්න.

(ආ) පොදු සමාගමක් නිල ලේඛනගත සමාගමක් බවට පත් කිරීමේ වාසි **දෙකක්** සහ අවාසි **දෙකක්** ලියන්න. (ලකුණු 04 යි)

(iii) රුපියල් මිලියන 5 ක් වටිනා ඉඩමක හිමිකරු ජෙනවිට් ප්‍රේමලාල් යන අය ද, ගැනුම්කරු ඔබ යැයි ද, උපකල්පනය කරන්න. ඔබගේ ජංගම ගිණුම පොලොන්නරුව ලංකා බැංකු ශාඛාවේ ද, ප්‍රේමලාලගේ ජංගම ගිණුම දඹුල්ල මහජන බැංකුවේ ද පවත්වා ගෙන යනු ඇත. ඉහත මුදල අද දින චෙක්පතකින් ගෙවීමට අදහස් කරයි. චෙක්පතක ආකෘතියක් ඇඳ **උපරිම ආරක්ෂාව** සැලසෙන පරිදි අදාළ චෙක්පත ලියා දක්වන්න. (ලකුණු 04 යි)

(iv) ''තොටිල්ල පදවන අත ලොව ආණ්ඩු කෙරේ.'' (The Hand That Rocks The Cradle Rules The World) කාන්තා ව්‍යවසායකත්වය ගැන කියවෙන මෙම වැකියේ අදහස පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

(v) ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර (ATM) සහ ස්වයංක්‍රීය තැන්පතු යන්ත්‍ර (ADM) මෙරට වාණිජ බැංකු විසින් සිය බැංකු ශාඛා ඉදිරිපිට ස්ථාපිත කර ඇත. මින් බැංකුවට හා ගනුදෙනුකරුට අත්කර ගත හැකි ප්‍රතිලාභ **දෙක** බැගින් පෙන්වා දෙන්න. (ලකුණු 04 යි)

(මුළු ලකුණු 20 යි)

## II කොටස

(මෙම කොටසින් ප්‍රශ්න දෙකක් තෝරා ගන්න)

04. සහජ නිර්මාණ කුසලතාවකින් හෙබි ගීතරාවී ඓතිහාසික නගරයක ජීවත් වෙයි. ඇය නව නිර්මාණ කිරීමට ළමා වියේ සිට ම ප්‍රියතාවක් දැක්වූවා ය. පාසල් අධ්‍යාපනයෙන් පසු ඇය බතික් නිර්මාණ ශිල්පය පිළිබඳ පාඨමාලාවක් හැදෑරී ය. බතික් නිර්මාණ ප්‍රදර්ශනයක් නැරඹීමෙන් පසු බතික් ඇඳුම් සැකසීමේ ව්‍යාපාරයක් ඇරඹීමට ඇය සිහින මැව්වා ය. රජය දේශීය බතික් කර්මාන්තය සඳහා දිරිගැන්වීම් ලබා දෙන බැවින් ගීතරාවී, ඇඳුම් මැසීම පිළිබඳ විශේෂ හැකියාවක් ඇති සංගීත්ගේ ද සහාය ඇතිව බතික් ඇඳුම් සැකසීමේ ව්‍යාපාරයක් ඇරඹීමට තීරණය කළා ය. ව්‍යාපාරයේ නිපදවන බතික් ඇඳුම් එම ප්‍රදේශයට පැමිණෙන සංචාරකයින්ට මෙන් ම දේශීය පාරිභෝගිකයින් සඳහා ද නිමි ඇඳුම් වෙළෙඳ සැල් මගින් අලෙවි කිරීමට ඔවුහු අපේක්ෂා කරති. තම නිෂ්පාදිත පිළිබඳ විස්තර, අත් පත්‍රිකා හා අන්තර්ජාලය මගින් ප්‍රචාරය කිරීමටත් ඔවුහු බලාපොරොත්තු වෙති.

(i) (අ) ගීතරාවීට ව්‍යාපාර අදහසක් පහළ වීමට හේතු වූ මූලාශ්‍ර **දෙකක්** ලියන්න.

(ආ) ගීතරාවී සතු ව්‍යවසායකත්ව ගති ලක්ෂණ **දෙකක්** ලියන්න. (ලකුණු 04 යි)

(ii) (අ) ගීතරාවී සහ සංගීත්ගේ ව්‍යාපාරයේ **ශක්තියක්** හා **අවස්ථාවක්** ලියන්න.

(ආ) මෙම ව්‍යාපාරය ආරම්භ කරන්නන්ට රජයේ දිරිගැන්වීම් අවශ්‍ය වීමට හේතු **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 04 යි)

(iii) (අ) ගීතරාවී සහ සංගීත්ට ආරම්භ කළ හැකි ව්‍යාපාර සංවිධාන වර්ග **දෙකක්** දක්වන්න.

(ආ) අන්තර්ජාලය මගින් ව්‍යාපාරය පිළිබඳ ප්‍රචාරය කිරීමේ වාසි හා අවාසි **දෙක** බැගින් ලියන්න.

(ලකුණු 04 යි)

(iv) පහත දක්වෙන්නේ 13 ශ්‍රේණියේ ඉගෙනුම ලබන සුනන්ද සිදුකරනු ලැබූ කාර්ය දෙකකි.

1. මාර්ගගත (Online) ක්‍රමයට ව්‍යාපාර අධ්‍යයනය විෂයයට අදාළ පාඩමකට සහභාගී වීම
2. නැගණිය සමග ගිටාරය වාදනය කිරීම

ඉහත එකිනෙක කාර්යවලින් ගම්‍ය වන මිනිස් අවශ්‍යතාව සඳහන් කර, ඒවා සපුරාගෙන ඇති ආකාරය ලියන්න. (පිළිතුරු ලිවීම සඳහා පහත ආකාරයේ වගුවක් භාවිත කරන්න)

| **මිනිස් අවශ්‍යතාව** | **සපුරාගෙන ඇති ආකාරය** |
|---|---|
| | |
| | |

(ලකුණු 04 යි)

(v) සුරාජ් රබර් නිපැයුම් ව්‍යාපාරයේ හිමිකරු වන පැරකුම්, ඉහළ යන පාරිභෝගික ඉල්ලුමට මුහුණ දීම සඳහා සිය ව්‍යාපාරය පුළුල් කිරීමේ අදහසින් බැංකු ණයක් අයදුම් කළ විට, දැන ගැනීමට හැකි වූයේ රජය විසින් වාර්ෂික බැංකු ණය පොලී අනුපාතය 12% සිට 8% දක්වා අඩුකර ඇති බවයි.

(අ) ඉහත සිද්ධිය තුළින් ගම්‍ය වන සාර්ව පරිසර සාධකය කුමක් ද ?

(ආ) ඉහත සිද්ධියෙහි ඇතුළත් වන සුරාජ් රබර් නිපැයුම් ව්‍යාපාරයේ ඇල්මැති පාර්ශ්ව **හතරක්** ලියන්න. (ලකුණු 04 යි)

(මුළු ලකුණු 20 යි)

05. (i) (අ) සමරු තිළිණ හා විසිතුරු නිෂ්පාදන අලෙවි කිරීමට ප්‍රසාද් දර්ශන මහතා තනිව හෝ තම පුතුන් දෙදෙනෙකු සමග හෝ ව්‍යාපාරයක් ඇරඹීමට සැලසුම් කර ඇත. එහිදී අදාළ ව්‍යාපාරයට තම නමේ **දර්ශන** යන පදය පමණක් භාවිත කරමින් ලියාපදිංචි කිරීමට බලාපොරොත්තු වේ. පහත ව්‍යාපාර සංවිධාන වර්ග අනුව ව්‍යාපාරයට නම් යොදන ආකාරය පහත වගුව තුළින් පෙන්වා දෙන්න.

| ව්‍යාපාර සංවිධාන වර්ගය | යෝජිත නාමය |
|---|---|
| කේවල ස්වාමි ව්‍යාපාරය | |
| හවුල් ව්‍යාපාරය | |
| සීමිත පෞද්ගලික සමාගම | |
| ලැයිස්තුගත නොකළ පොදු සමාගම | |
| ලැයිස්තුගත සමාගම | |
| සමූපකාරය | |

(ආ) **"ව්‍යාපාර සංයෝජන"** යන පදය පැහැදිලි කරන්න (ලකුණු 04 යි)

(ii) ''කාර්යක්ෂම ප්‍රවාහන පද්ධතියක් නොමැතිව ආර්ථික සංවර්ධනයක් ඇති කළ නොහැක''. අදහස් දක්වන්න. (ලකුණු 04 යි)

(iii) (අ) **පිටතට කෙරෙන සැපයුම් සේවා** (Outbound Logistics) පද්ධතියක් ව්‍යාපාරයක් සඵලදායීව භාවිත කිරීමෙන් ව්‍යාපාරිකයාට හා ගනුදෙනුකරුට අත්වන ප්‍රතිලාභ **දෙක** බැගින් ලියන්න.

(ආ) භාණ්ඩ ඇසිරීම සඳහා **ස්වයංක්‍රීය ඇසුරුම් ක්‍රමය** (Automated Storage System) භාවිත කිරීමෙන් ව්‍යාපාරයට අත්කර ගත හැකි වාසි **දෙකක්** හා අවාසි **දෙකක්** ලියන්න. (ලකුණු 04 යි)

(iv) සරදියෙල් චීනයේ සිට කාබණික පොහොර තොගයක් ආනයනය කිරීමට තීරණය කර ඇත. මේ සඳහා ඩොලර් බිලියන 5 ක් ගෙවීමට සිදුව ඇති අතර ඒ සඳහා ඔහුට භාවිත කළ හැකි ගෙවීම් මාධ්‍ය **හතරක්** ලියන්න. (ලකුණු 04 යි)

(v) (අ) සිය ව්‍යාපාර කටයුතු සඳහා Mata නැතහොත් Face book සමාජ ජාලය භාවිත කිරීමෙන් ව්‍යාපාරිකයෙකුට ලබාගත හැකි වාසි **දෙකක්** හා අත්විය හැකි අවාසි **දෙකක්** සඳහන් කරන්න.

(ආ) "ඉලෙක්ට්‍රොනික් සන්නිවේදනය නැතහොත් සමාජ ජාල ව්‍යාප්ත වීමත් සමග බොහෝ රටවල විවිධ සමාජ ගැටලුද උද්ගත වෙමින් පවතී." ඔබ දකින එවැනි ගැටලු **දෙකක්** නම් කරන්න. (ලකුණු 04 යි)

(මුළු ලකුණු 20 යි)

06. (i) (අ) රක්ෂණයේ දී **අවදානම** (Risk) යන සංකල්පය පැහැදිලි කර රක්ෂණය කළ හැකි අවදානමක පැවතිය යුතු මූලික ලක්ෂණ සඳහන් කරන්න.

(ආ) පරිත්‍යාග ජීවිත රක්ෂණ ඔප්පුව ලබා ගෙන සිටි සුලෝචනා කොරෝනා වෛරසයට ගොදුරු වී IDH රෝහලේ දී අවාසනාවන්ත ලෙස මිය ගිය අතර සෞඛ්‍යාරක්ෂිත පිළිවෙත් යටතේ රජය විසින් ඇයගේ අවසන් කටයුතු උඩහමුල්ල ආදාහනාගාරයේ දී සිදුකර ඇත. අවිවාහක ඇයගේ පියා විසින් අදාළ රක්ෂණ ඔප්පුව යටතේ අලියා රක්ෂණ සමාගමෙන් වන්දි ඉල්ලා සිටී. ඇයගේ පියා වෙත රක්ෂණ සමාගම වන්දි ගෙවීමට බැඳී සිටී ද ? ඔබගේ නිගමනය පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

(ii) (අ) ලිපි මගින් තොරතුරු සන්නිවේදනය කිරීමේ වාසි **දෙකක්** හා අවාසි **දෙකක්** ලියන්න.

(ආ) **ආර්ථික මධ්‍යස්ථාන** ගොවි සහ වෙළෙඳ ප්‍රජාවට වැදගත් වන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

(iii) (අ) පහත දක්වෙන්නේ ආනයන, අපනයන වෙළෙඳාමේ දී භාවිත කෙරෙන ලියකියවිලි කිහිපයකි. එම ලියකියවිලිවලින් අපේක්ෂා කරන්නේ කුමක් දැයි වෙන් වෙන් වශයෙන් සඳහන් කරන්න.

1) නෞභාර පත්‍රය
2) ණයවර ලිපිය
3) ප්‍රභවස්ථාන සහතිකය
4) ආනයන සටහන්කරය

(ආ) කොවිඩ් ව්‍යාප්තිය හා ගුරු විදුහල්පති වැඩ වර්ජනය නිසා පාසල් වසා දැමීමත් සමඟ අධ්‍යයන කටයුතු සඳහා විද්‍යුත් ඉගෙනුම් ක්‍රියාවලිය බහුලව යොදා ගනු ලැබී ය. විද්‍යුත් ඉගෙනුම් ක්‍රියාවලියෙන් පාසල් සිසුන් මුහුණ දෙන ගැටලු **දෙකක්** සහ ඒ සඳහා උචිත විසඳුම් **දෙකක්** ඉදිරිපත් කරන්න. (ලකුණු 04 යි)

(iv) (අ) දේශීය ව්‍යාපාර බහුලව භාවිත කරන භාණ්ඩ ඇසුරුම් ක්‍රම **දෙකක්** නම් කර කෙටියෙන් පැහැදිලි කරන්න.

(ආ) නිෂ්පාදිත පාරිභෝගිකයාට සැපයීමේ දී ප්‍රවාහන හා සැපයුම් සේවාවල දායකත්වය පෙන්වා දෙන්න. (ලකුණු 04 යි)

(v) (අ) "ආනයන පාලනය මෑත භාගයේ දී වඩාත් කථා බහට ලක් වී ඇති මාතෘකාවකි." මෙරටට ආනයනය කරන භාණ්ඩ පාලනය සඳහා කටයුතු කරන රාජ්‍ය ආයතන **දෙකක්** නම් කර, ඒ සඳහා එම ආයතන යොදා ගන්නා පාලන පිළිවෙත් **දෙකක්** ලියන්න.

(ආ) ඇමරිකානු ඩොලරයට සාපේක්ෂ ව ශ්‍රී ලංකා රුපියල මෑත කාලයේ වේගයෙන් ක්ෂයවීමට භාජනය විය. මෙය ශ්‍රී ලංකාවේ ආනයන හා අපනයන වෙළෙඳාමට කෙසේ බලපෑම් කරන්නේදැයි පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

(මුළු ලකුණු 20 යි)

***

සැකසුම ඃ බණ්ඩාර දිසානායක.
B.Sc.(Mgt) Sp.